**ශීර්ෂය 112 - විදේශ කටයුතු අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත්කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත් කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන් , රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

ශීර්ෂය 112 - විදේශ කටයුතු අමාත්‍යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම් , මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල වීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කර ගෙන අදාල පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ජූනි 05 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණ

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.10 දක්වා ඡේද වල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 127 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත

සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටුකර තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 127 ප්‍රකාර ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම** | **නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව** |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 127 (1)(අ) | නිවැරදිව සහ මූල්‍ය විධිමත් බවෙන් යුක්තව කටයුතු කරන බව තහවුරු වන පරිදි සියළු මූල්‍ය කාර්යයන් සැලැසුම් කළ යුතු වීම. | ක්‍රියාකාරී සැලැස්ම නිවැරදි ලෙස පිළියෙල කර නොතිබීම. | 2.1 |
| 127(3) | ස්වකීය පරිපාලනාත්මක කෘතහස්තතාව හා විචාර බුද්ධිය මෙහෙයවා සුදුසු පරිදි ක්‍රියා කළ හැකි වන පිණිස සැකයක් හෝ උද්ගත වී ඇති සියළු ප්‍රශ්න තමා වෙත ඉදිරිපත් වන ආකාරයක් සලසා තිබීම. | නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම් පැවතීම. | 2.3 (අ) |
| 127(4) | තමාගේ එක් එක් ගණන්දීමේ නිලධාරියා විසින් විසර්ජන ගිණුම් විධිවූ පරිදි ඉදිරිපත් කරන බවට හා තමා ඒවා අත්සන් කිරීමට පෙර අමාත්‍යාංශයේදී පරීක්ෂා කරන බවටත්, එසේම ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල සහ තථ්‍ය වියදම අතර පවත්නා සැලැකිය යුතු වෙනස්කම් තමා විසින්ම, දැඩි ලෙස විමර්ශනයට භාජනය කිරීම | 1. අග්‍රිම ගිණුමේ අඩුපාඩු | 2.6 |
| | | 2. පොදු තැන්පත් ගිණුම්වල අඩුපාඩු | 2.7 |
| | | 3. බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු | 2.8 |
| 127(5) | දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුවල ප්‍රතිපාදිත මුදල හා වියදම අතර ඇති සැලකිය යුතු වෙනස් වීම් අමාත්‍යාංශයේ දැඩි ලෙස පරීක්ෂණයට භාජනය කෙරෙන බව | අධි ප්‍රතිපාදනය තිබීම. | 2.4 |
| 127(6) | ගණන්දීමේ නිලධාරීගේ වගකීම පිට පවත්නා වූ ආදායම් නොහොත් රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු එකතු කිරීමේ කාර්යය ගැන දැඩි සෙවිල්ලෙන් සිටිමින් එම කාර්යය අමාත්‍යාංශයේ පරීක්ෂණයකට භාජනය කිරීම | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සඳහන් අඩුපාඩු | 2.5 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 කාර්යසාධනය

**සැලැසුම් කිරීම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා අමාත්‍යාංශය හා දූත මණ්ඩල වෙනුවෙන් වෙනවෙනම ක්‍රියාකාරි සැලැසුම් පිළියෙල කර තිබුණි.

විදේශ දූත මණ්ඩලවලට අදාළව පිළියෙළ කර තිබූ ක්‍රියාකාරි සැලැස්මෙහි සමාලෝචිත වර්ෂයට අදාල වාර්ෂික අයවැය පදනම් කර ගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම්හි ක්‍රියාත්මක වියයුතු කාල රාමුව (Time Line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල (Output/ Outcome) ඇස්තමේන්තු කර සඳහන් කර නොතිබුණි.

### 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයීම් සේවා ලබා ගැනීම

අමාත්‍යාංශය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කරමින් සැපයීම් හා සේවා ලබා ගත යුතු වූ රු. මිලියන 1211.8 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර ඉන් රු. මිලියන 338.2 ප්‍රතිපාදන උපයෝජනය කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| වැය විෂය | වැය විෂය විස්තරය | සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය |
|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| | **සැපයීම්** | | | |
| 1201 | - ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 80.2 | 80.2 | - |
| 1203 | - ආහාර පාන හා නිල ඇඳුම් | 2.6 | 2.6 | - |
| 1205 | - වෙනත් | 7.5 | 7.5 | - |
| | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | | |
| 2101 | - වාහන | 83.0 | 78.2 | 4.8 |
| 2102 | - ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ | 84.9 | 69.9 | 15.0 |
| 2103 | - යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ | 19.7 | 15.8 | 3.9 |
| 2104 | - ගොඩනැගිලි ඉදිකිරීම් | 923.9 | 79.0 | 844.9 |
| 2105 | - ඉඩම් හා ඉඩම් වැඩි දියුණු කිරීම | 10.0 | 5.0 | 5.0 |
| | එකතුව | 1211.8 | 338.2 | 873.6 |

#### 2.2.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශ ලේකම් කාර්යාලය හා රාජ්‍ය අමාත්‍ය කාර්යාලයේ පිරිවැය රු.මිලියන3.26ක් වූ ලී සිවිලිම පිරිසැකසුම් සහ සවි කිරීම් පිළිබඳ ප්‍රසම්පාදනයේ පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) වෙළඳපොළ අනුව මිල සැඳහුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවීමේදී ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලේඛනගත කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීම් කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන කමිටුව විසින් ලංසු විවෘත කිරීමේ කමිටුවක් පත් කර ප්‍රසිද්ධියේ ලංසු විවෘත කිරීමේ ක්‍රියා පටිපාටි අනුගමනය කර නොතිබුණි.

(ආ) මේසය මත තබන පරිගණක, ලේසර් මුද්‍රණ යන්ත්‍ර සහ නිරන්තර බල සැපයුම් සැපයීම සම්බන්ධයෙන් එකතුව රු.මිලියන 7.62 ක් වූ ප්‍රසම්පාදනය පරීක්ෂා කිරීමේදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) අමාත්‍යාංශය විසින් පරිගණක, ලේසර් මුද්‍රණ යන්ත්‍ර සහ නිරන්තර බලසැපයුම් මිලදී ගැනීමේදී සැපයුම්කරු සමඟ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදනයේදී තෝරාගත් සැපයුම් ආයතන දෙක වෙත මිල දී ගැනීමේ ඇණවුම් ලබා දී තිබූ 2017 මාර්තු 21 දින වන විට එම උපකරණවල ලංසු සුරක්ෂණවල වලංගු කාලය ඉක්මවා ගොස් තිබුණි.

(iii) 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව අමාත්‍යාංශය විසින් පරිගණක 31 ක් හා මුද්‍රණ යන්ත්‍ර (Printers) 11 ක් මිලදී ගැනීමට සැලැසුම් කර තිබූ නමුත්, සැලසුමට පටහැනි ලෙස මුද්‍රණ යන්ත්‍ර 27 ක් සහ නිරන්තර බල සැපයුම් 42 ක් මිලදී ගෙන තිබුණි.

## 2.3 වත්කම් කළමනාකරණය

### (අ) නිෂ්ක්‍රීය වත්කම්

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව පැවැති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | වටිනාකම | නිෂ්ක්‍රීයව පැවැති කාලය |
|---|---|---|---|---|
| | | | | වර්ෂය |
| (i) | මැලේසියාවේ ක්වාලාලාම්පූර් මහ කොමසාරිස් කාර්යාලයට අයත් පුත්‍රජයාහි ඉඩම | අක්කර 1.681 | ඇ.ඩො. මිලියන 1.2 | 2007 - 2018 |

(ii) ගොඩනැගිලි

| | | | |
|---|---|---|---|
| • ඕස්ට්‍රේලියාවේ කැන්බරා මහ කොමසාරිස් කාර්යාලය සතු ගොඩනැගිල්ල | 01 | ඇ.ඩො. මිලියන 2.5 | 2007-2018 |
| • -එම- | 01 | | 2012- 2018 |
| • ස්විඩන්හි ස්ටොක්හෝම් තානාපති නිල නිවස | 01 | රු. මිලියන 277.3 | 2011 - 2018 |

මැලේසියාවේ ක්වාලාලාම්පූර් හි පිහිටි මහ කොමසාරිස් නිල නිවසෙහි අලුත්වැඩියා කටයුතු ගිවිසුම අනුව 2016 පෙබරවාරි 21 දින නියමිත පරිදි අවසන් කර නිල නිවස භාර නොදීම හේතුවෙන් 2016 මාර්තු සිට 2018 ජුනි 30 වන දින දක්වා මහ කොමසාරිස්වරයා පදිංචිව සිටින කුලී නිවාසය සඳහා එකතුව මැලේසියානු රිංගිට්ස් (RM) 532,000 ක් වූ කුලී ගාස්තුවක් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් පරිහරණය කිරීම**

ඇල්විටිගල මාවතේ නිවාසවල ඉදිකිරීම් කටයුතු නිමකළ වහාම, අදාළ සමුළු මහල් නිවාස සුදුසු වෙනත් නිලධාරීන්ට වෙන්කර දීමට හැකිවනු පිණිස, එකී නිවාසවල පදිංචිව සිටින විදේශ සේවයට අයත් නිලධාරීන් ඉවත්විය යුතු බවට 2000 ඔක්තෝබර් 25 දින රැස්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය වී තිබුණි. එසේ වුවද, ඇල්විටිගල මාවතේ නිවාසවල ඉදිකිරීම් අවසන් වී ඇතත් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට අයත් සමුළු නිවාස 07 ආපසු භාර දීමට 2018 අගෝස්තු 28 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

## 2.4 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ අමාත්‍යාංශයට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| 2013 | පුනරාවර්තන | 7,718 | 7,702 | 16 | 0.2 |
| | මූලධන | 2,422 | 2,303 | 119 | 4.9 |
| | **එකතුව** | **10,140** | **10,005** | **135** | **1.3** |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2014 | පුනරාවර්තන | 8,827 | 8,813 | 14 | 0.2 |
| | මූලධන | 1,236 | 956 | 280 | 22.6 |
| | **එකතුව** | **10,063** | **9,770** | **293** | **2.9** |
| 2015 | පුනරාවර්තන | 9,025 | 8,011 | 1,014 | 11.2 |
| | මූලධන | 1,081 | 533 | 548 | 50.6 |
| | **එකතුව** | **10,106** | **8,544** | **1,562** | **15.4** |
| 2016 | පුනරාවර්තන | 9,450 | 8,941 | 509 | 5.4 |
| | මූලධන | 520 | 420 | 100 | 19.2 |
| | **එකතුව** | 9,969 | 9,361 | 608 | 6.1 |
| 2017 | පුනරාවර්තන | 9,677.23 | 9,622.99 | 54.24 | 0.6 |
| | මූලධන | 1,334.64 | 326.19 | 1,008.45 | 75.6 |
| | **එකතුව** | **11,011.87** | **9,949.18** | **1,062.69** | **9.6** |

සමාලෝචිත වර්ෂයට අදාළව පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 2 ක් සඳහා සලසා තිබූ සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 15 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා සමාලෝචිත වර්ෂයේදී උපයෝජනය කළ පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 22 සිට සියයට 90 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**2.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 11201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 35 | 33.23 | 28 | 29.12 | 130 | 110.10 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසදුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. මිලියන 4.14 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 01ක සිට වර්ෂ 23 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

(ආ) අමාත්‍යාංශය විසින් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක සිට පැවත එන එකතුව රු.මිලියන 1.51 ක් වූ හඳුනා නොගත් ණය ශේෂ සම්බන්ධයෙන් 2018 අගෝස්තු 28 දින වන විටත් කිසිඳු පියවරක් ගෙන නොතිබුණි.

## 2.6 අග්‍රිම ගිණුම්

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේ දී අමාත්‍යාංශය විසින් ලබා දුන් රු. 100,000 ක අත්තිකාරම් මුදලක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පියවා නොතිබුණි.

(ආ) 2018 ජුනි 30 දිනට විදේශ දූත මණ්ඩල කාර්යාල විසින් පියවා නොතිබූ අත්තිකාරම් ශේෂ එකතුව රු. මිලියන 318.08 ක් විය. එම ශේෂ එකතුවෙන් වර්ෂ 2කට අඩු රු.මිලියන 99.88 ශේෂයක් ද, වර්ෂ 2 සිට 5 දක්වා පැරණි රු.මිලියන 110.70 ශේෂයක් ද, වර්ෂ 5 ට වැඩි රු.මිලියන 107.49 ශේෂයක් ද පැවතුණි.

## 2.7 පොදු තැන්පත් ගිණුම්

-------------------------

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුමේ 2018 ජුනි 30 දිනට ශේෂවල එකතුව රු. මිලියන 174.23 ක් විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 ජුනි 30 දිනට දූත මණ්ඩල කාර්යාල පොදු තැන්පත් ගිණුමේ වර්ෂ 02 ක් කල් ඉකුත් වූ එකතුව රු.මිලියන 5.56 ක ශේෂ පැවති අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 565 (5) ප්‍රකාරව එක් එක් මාසය සඳහා පිළියෙල කළ මාසික තැන්පතු සාරාංශ ප්‍රකාශයක් ඊළග මාසය අවසන් වීමට පෙර විගණකාධිපති වෙත යැවිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 2.8 බැංකු ගිණුම් මෙහෙයවීම

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2018 ජුනි 30 දිනට අමාත්‍යාංශය පවත්වා ගෙන යන බැංකු ගිණුම් 02න් එක් බැංකු ගිණුමක 2016 හා 2017 වර්ෂවලට අදාළව රු.මිලියන 1.3 ක් හඳුනා නොගත් ගෙවීම් ලෙස බැංකු සැසඳුමට ගලපා තිබුණි.

(ආ) අමාත්‍යාංශයේ බැංකු ගිණුමක 2018 ජුනි 30 දිනට මාස 06 ඉක්මවූ රු.මිලියන 1.39 ක චෙක්පත් 12 ක් සම්බන්ධව මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේ ලොස් ඇන්ජලීස් කන්සියුලර් ජනරාල් කාර්යාලයෙන් සොරා ගන්නා ලද USD 1583 ක මුදල සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව හානි හා පාඩු ලෙස සලකා කටයුතු කිරීමකින් තොරව දිගින් දිගටම බැංකු සැසඳුම මඟින් හෙළිදරව් කිරීමට පමණක් කටයුතු කර තිබුණි.

## 2.9 අනුකූල නොවීම

-------------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2013 අප්‍රේල් 01 දිනැති අංක OM/E7/6/2013 දරන විදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව විදේශ දූත මණ්ඩල නිලධාරීන්ට විශේෂ දීමනාව ගෙවිය යුතු වුවද නිලධාරීන් දෙදෙනෙකුට එකතුව රු.163,780 ක් විශේෂ දීමනාව වැඩියෙන් ගෙවා තිබුණි. එම වැඩිපුර ගෙවීම 2018 අගෝස්තු 28 දින වනවිටත් ආපසු අයකරගෙන නොතිබුණි.

## 2.10 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

-------------------------------------------------------------------------------------------

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටු කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අමාත්‍යාංශය විසින් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 1,486.20 ක් වැය කර තිබුණි.

(අ) **අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය**

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 95 | 92 | 3 |
| (ii) | තෘතියික මට්ටම | 7 | 6 | 1 |
| (iii) | ද්විතියික මට්ටම | 361 | 337 | 24 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 125 | 124 | 1 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 55 | 12 | 43 |
| | **එකතුව** | **643** | **571** | **72** |

**(ආ)** **දූත මණ්ඩල කාර්ය මණ්ඩලය**

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| | සියරට පේරුව (Home Based) | | | |
| (i) | ජ්‍යෙෂ්ඨ/ තෘතීයික * | 262 | 232 | 30 |
| (ii) | ද්විතීයික** | 254 | 254 | - |

| | | | | |
|---|---|---|---|---|
| (iii) | ප්‍රාථමික*** | 07 | 04 | 03 |
| | | ------ | ------ | ------ |
| | | **523** | **490** | **33** |
| | **එකතුව** | === | ==== | === |
| | ස්ථානීය නොවන (Locally recruited) | | | |
| | ------------------------------------------ | | | |
| (i) | ද්විතීයික** | 311 | 292 | 19 |
| (ii) | ප්‍රාථමික*** | 360 | 360 | - |
| | | ------ | ------- | ------ |
| | | **671** | **652** | **19** |
| | **එකතුව** | === | === | === |

* ජ්‍යෙෂ්ඨ/ තෘතීයික- දූත මණ්ඩල ප්‍රධානී, අමාත්‍ය, අමාත්‍ය උපදේශක, උපදේශක, පළමු ලේකම්, දෙවන ලේකම්, තෙවන ලේකම්

** ද්විතීයික - සංධාන සහකාර, තොරතුරු තාක්ෂණ නිලධාරීන් ඇතුළු රාජ්‍ය කළමනාකරණ සේවයේ නිලධාරීන්

ස්ථානීය නොවන ද්විතීයික - ලිපිකරු, පිළිගැනීමේ නිලධාරීන්, ලඝු ලේඛක, භාෂා පරිවර්තක, තොරතුරු තාක්ෂණ නිලධාරීන් ඇතුළු නිලධාරීන්

*** ප්‍රාථමික - රියදුරු, කාර්යාල සහයක, පිරිසිදු කරන්නන් ඇතුළු නිලධාරීන්